# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1504/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 23/09/2024<br>පැය 1610 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න 03 ක් පිටවීම සම්බන්ධව සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව**

2024.09.15 වන දින පවත්වන ලද 05 වසර ශිෂ්‍යත්වය විභාගයේ පළමු ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 03 ක් උපකාරක පන්ති ගුරුවරයෙකු විසින් ආදර්ශ ප්‍රශ්න පත්‍රයකට ඇතුලත් කර ශිෂ්‍යත්ව විභාගයට පෙර දින WhatsApp හරහා මුද්‍රා හැරීමක් සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිල්ලක් අනුව විමර්ශන ආරම්භ කර තිබිණි.

ඒ අනුව, ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍රයේ රහස්‍ය තොරතුරු බාහිරට ලබාදීම හේතුව මත ප්‍රශ්න පත්‍ර සාදන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ පුද්ගලයෙකු 2024.09.22 වන දින කුරුණෑගල ප්‍රදේශයේදී අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වූ තිත්තවැල්ල, කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සැකකරු මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ, සැලසුම් හා මෙහෙයුම් ලෙස කටයුතු කරන අයෙකු බවට අනාවරණය වී ඇති අතර අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**